# හෝමර් සැබෑ මිනිසෙක්ද? කල්පිතයක්ද?



බටහිර සාහිත්‍යයේ එන ඉලියඩ් සහ ඔඩිසි නම් වීර කාව්‍යයන් දෙකෙහි රචකයා ලෙස සැලකෙන හෝමර්, ග්‍රීක සාහිත්‍ය ක්ෂේත්‍රයේ මෙතෙක් බිහි වූ විශිෂ්ඨතමයා ලෙස අදටත් පිලිගැනේ. බටහිර සාහිත්‍යකරණයේ මුල් අවධියේදී ලියවුනා යැයි විශ්වාස කෙරෙන ඉලියඩ් සහ ඔඩිසි කාව්‍යයන් මගින් බටහිර සාහිත්‍යයේ ඉතිහාසය සහ විකාශනයට දක්වන ලද අනුග්‍රහය ද ඉමහත්ය.

හෝමර්, සැබැවින්ම එවැන්නෙක් විසුවේද? එසේ නම් කුමණ කාල වකවානුවක දැයි තවමත් කිසිවෙකුටත් නිශ්චිත නිගමනයකට පැමිණීමට හැකි වී නැත. ක්‍රි.පූ. 854 දී පමණ ඔහු ජීවත් වන්නට ඇතැයි ග්‍රීක ඉතිහාසඥයෙකු වන හෙරඩොටස් අනුමාන කරයි. තවත් පෞරාණික සාධක නිරීක්ෂණයේදී හෝමර් ක්‍රි.පූ. දොළොස්වන සියවසේ ට්‍රෝජන් යුද සමයට ආසන්න කාලයක ජීවත් වන්නට ඇතැයි සමහරෙක් පවසන අතර නූතන නිරීක්ෂක කණ්ඩායම් හෝමර්ව තබන්නේ ක්‍රි.පූ. හත්වන හෝ අටවන සියවස් වලය.

"ග්‍රීසියේ ගුරුවරයා" නමින් අදටත් හැඳින්වෙන හෝමර්ගේ වීර කාව්‍ය රචනා විධි ක්‍රම සහ හෝමරියානු සාහිත්‍යානුභාවය ග්‍රීක සංස්කෘතිය විචිත්‍රවත් වීමට අතිශයින් බලපෑ බව කිසිවෙකුටත් රහසක් නොවේ. හෝමර්ගේ යැයි සැලකෙන ලිඛිත සටහන් දැනට ශේෂව ඇති පැපිරස් පත්‍රිකාවන්ට




අනුව, ඔහුගේ නිර්මාණ වලින් සියයට පනහක් පමණ වූ භාෂිත සටහන්, පුරාතණ සහ මධ්‍යකාලීන ග්‍රීසියේ අතිප්‍රභල කථනයන්ට සහ ලේඛනයන්ට ආකෘති සපයා දී ඇති බව ද ප්‍රචලිතය.

නූතන විද්වතුන්ට අනුව හෝමර්ගේ කාලය යනු වීර කාව්‍යයන් ලියැවුනු යුගයක්ම මිස හුදෙක් තනි මිනිසකු විසූ කාලයක් නම් නොවන්නේය. විද්වතුන්ගේ හා ඉතිහාසඥයින්ගේ පොදු එකගතාවයකට අනුව ඔඩිසි වීර කාව්‍යය ලිය වී ඇත්තේ ක්‍රිස්තු පූර්ව 8 දී පමණ වුවත් ඉලියඩ් ඊට දශක ගණනකට පෙර, එනම් ක්‍රිස්තු පූර්ව 750-650 කාලයේ විසුවා යැයි කියවෙන හෙසියඩ් කිවියරයාණයන්ට ද පෙර කාලයක ලියවෙන්නට ඇතැයි සැලකේ. එහෙයින් බටහිර සාහිත්‍යයේ ඉපැරණිම නිර්මාණය බවට ඉලියඩ් පත් වී ඇත.

ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ භාෂාව හා සාහිත්‍යය පිළිබඳ මහාචාර්යවරයෙකු වූ ඔලිවර් ටැප්ලින්ගේ විශ්වාසය නම් හෝමර්ගේ යුගය වන්නේ ක්‍රිස්තු පූර්ව 750-650 කාලයයි. හාවර්ඩ් විශ්ව විද්‍යාලයේ සම්භාව්‍ය සාහිත්‍යය පිළිබඳ මහාචාර්යවරයෙකු වූ ග්‍රෙගරි නැගීගේ මතය වන්නේ හෝමරියානු කවි කාලාන්තරයක් තිස්සේ විවිධ සාහිත්‍යධරයන් අතින් පොහොණි වෙමින් වර්ධනය වෙමින් පැවත ගෙන විත් ක්‍රිස්තු පූර්ව 6 වෙනි සියවසේදී ලේඛණගත වන්නට ඇති බවයි.

හෝමර් නම් වූ පුද්ගලයෙකු ගැන පිළිගත හැකි චරිතාපදානයන් පිළිබඳ සාක්ෂි සටහන් කිසිවක් සාහිත්‍ය ඉතිහාසයේ කොතනකවත් සඳහන් වන්නේ නැත. එනිසාම "හෝමර් කවුරුන්ද?" යන ගැටළුව ග්‍රීක සාහිත්‍යධරයන් විසින් "හෝමරික් පැනය" (Homeric Question) ලෙස නම් කර ඒ පිළිබඳ පර්යේෂණ දියත් කරනු පෙනේ. හෝමර්ගේ කවි කාලාන්තරයක් තිස්සේ ගොඩ නැගුණු, මුඛ පරම්පරාවෙන් පැවත ආ කථාන්තර සම්ප්‍රදායක කූටප්‍රාප්තියක් ලෙසට පොදු මතය පවතියි. මෑත කාලයේ බිහි වූ විශිෂ්ඨතම ග්‍රීක සාහිත්‍යධරයා ලෙස ප්‍රචලිත ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ ආචාර්ය මාටින් ලිච්ෆීල්ඩ් වෙස්ට් පවසන්නේ හෝමර් යනු තනි මිනිසෙකු නොව ආත්මයක් කවා නිර්මාණය කරන ලද නාම මාත්‍රයක් පමණක් බවයි.

හෝමර් යනු ග්‍රීක නමකි. එය ඉයොලික් බස භාවිතා කල මධ්‍යම ග්‍රීසියේ බිහි වූ නමක් ලෙස ග්‍රීක ඉතිහාසඥයෝ හඳුනා ගනිති. හෝමර් නම් කවියෙකු පිළිබඳ කිසිදු තොරතුරක් අනාවරණය නොවුනද, හෝමර් යන නාමයේ උපත සිදුවන්නට ඇතැයි සැලකෙන මධ්‍යම ග්‍රීසිය හෝමර් උපන් බිම ලෙස හඳුන්වන්නට බොහෝ දෙනා උනන්දුවන බව පෙනේ. ග්‍රීක බසින්ම උපහාසාත්මක කාව්‍යකරණයෙහි යෙදුනු සිරියානු ජාතික ලූසියන් සමොසටා ඔහුගේ "සැබෑ ඉතිහාසය (True History) නම් වූ කෘතියෙන් දක්වන පරිදි "හෝමර්" යනු ටයිග්රේන්ස් (Tigranes) නම් වූ බැබිලෝනියානුවෙකු වන බවත්, ග්‍රීසියේදී පරණ ඇපකරුවෙකු බවට පත් වීමෙන් පසු එම බැබිලෝනියානුවා "හෝමර්" නමින් හැඳින්වූ බවත් සඳහන් කරයි. රෝමානු අධිරාජයෙකු වූ හැඩ්රියන් වරක් ග්‍රීසියේ ඩෙල්ෆි ප්‍රදේශයේ විසූ අනාගත වතෘවරයෙකුගෙන් "හෝමර් කවුරුන්දැ" යි විමසූ විටෙක, දැනගන්නට ලැබී ඇත්තේ හෝමර් ඉතාකා හි පදිංචිකරුවෙකු වූ බවයි. (ඉතාකා හෝමර්ගේ ඔඩිසි හි බෙහෙවින් විස්තර කෙරෙන ප්‍රදේශයකි.) තවද ඔහු ඔඩිසිහි එන චරිත ද්විත්වයක් වන ටිලිමකස් (ග්‍රීක මිත්‍යා කතාවන්හි එන ඔඩිසියස්ගේ හා පෙනිලොපීගේ පුත්‍රයා) සහ එපකස්ටාගේ පුත්‍රයා බවද එම කතෘවරයා ප්‍රකාශ කර ඇත.

ඇලෙක්සැන්ඩ්‍රියානු යුගයේ පටන්ම මෙබඳු මති මතාන්තර මත ගොඩ නැගුණු විවිද වූ ජීවිත කතාවන් රැසක් තනි මිනිසෙකැයි සිතිය හැකි නමුත් කල්පිතයක් ද විය හැකි හෝමර් නමින් ගෙතී ඇත. බොහෝ ලිඛිත හා භාෂිත සාධකයන්ට අනුව හෝමර්ගේ උපත, කුඩා ආසියාව ිස්-පසබදර* නමින් හැඳින්වෙන තුර්කි-ආසියානු අර්ධද්වීපයේ පිහිටි ඇනටෝලියාවේ මුහුදුබඩ පෙදෙසක් වන ලියෝන්යාහි ස්මිර්නා නම් ස්ථානයේ හෝ බයොස් :ජයසදි* දූපතේ සිදු වී ඇති අතර, මරණය සිදුවන්නට ඇතැයි සැලකෙන්නේ සයික්ලිඩිස් නම් වූ කුඩා දූපත් සමූහයේ ඇති "ලොස්" නම් වූ දූපතේ බව කියවේ. මෙම කරුණු සියල්ලේ ද සත්‍යාසතයතාවය තවමත් නිශ්චය වී නැත. හෝමර් යන නාමය පුරාණ ග්‍රීක උප භාෂාවක් වන ඉයොනික් :ෂදබසප්* භාෂාවේ එන "පුරාණ ඇපකරුවා" :යදපැරදිරැ්‍යදිඒටැ* යන යෙදුමේ හඬ රටාවට බෙහෙවින් සමාන වුවද අර්ථයෙන් සමාන නොවේ. එහි ගම්‍ය අර්ථය "එක්ව ගමන් කරන්නා" සහ නොකැමැත්තෙන් වුවද තවකෙකු අනුව යන්නා ආදී වශයෙන් වෙයි. ඒ අනුව හෝමර් "අන්ධ" මිනිසෙකු වන්නට ඇතැයි සමහරක් ලේඛණ වල දැක්වේ. හෝමර් අන්ධයෙක් ලෙස මිස පුරාණ ඇපකරුවෙකු ලෙස ග්‍රීකයින් විසින් පිළිගෙන නොමැති බව ඩිලෝසියානු දේව ස්තෝත්‍ර වල සිට ඇපලෝ දෙවියන් වෙනුවෙන් වූ ස්තෝත්‍ර දක්වාම " අඳ කිවියරයාණන්" ගේ චරිතයක් ඇතුලත් කර තිබීමෙන් පෙනී යයි. ("ඩිලොස් ", ග්‍රීසියේ ඇති පෞරාණික දූපතකි).

විචාරකයින් හා සම්භාව්‍ය සාහිත්‍ය පිළිබඳ පුරාවිද්‍යාඥයින් ද ඔඩිසිහි එන ඩිමොඩක්ස් නම් වූ අන්ධ කිවියරයාණන් පිළිබඳව කියැවෙන පාඨය ගෙනහැර දක්වමින් හෝමර් අන්ධ සාහිත්‍යධරයෙක්ම වන්නට ඇතැයි ඉඟි කරයි. නමුත් අන්ධයෙක් හෝ සාහිත්‍යධරයෙක් හෝ වන්නට ප්‍රථම, හෝමර් මිනිසෙකු විය යුතුය.

සියලු පුරාවිද්‍යාඥයන්ගේ අවධානය සහ උත්සාහය තවමත් පවතින්නේ ඔහු සැබැවින්ම මිනිසෙක් ද නැතහොත් කල්පිතයක් ද යන පැනයට විසඳුම් සෙවීමටය.

එහෙත් සියළුම ලේඛකයන්ගේ හා සාහිත්‍යධරයින්ගේ අවධානය සහ උත්සාහය වී ඇත්තේ හෝමර් නම් වූ ඒ අසහාය කල්පිතය හෝ මානවයාගේ නිර්මාණයන්ගෙන් හැඩ වූ කලාව සහ සාහිත්‍ය නැවත නැවතත් පෝෂණය කරමින් දිවියක සොඳුරු පැවැත්මක් උදෙසා නවමු නිර්මාණ බිහිකිරීමටය.




සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර www.thisara.com